# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2356/36 - 2023 නොවැම්බර් මස 03 වැනි සිකුරාදා - 2023.11.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේයොමු අංකය: KDS/AKU/4/2/1/101.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 4-3/18/2020/WS/585.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍යා පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන)පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය :*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 589 දරන විලාන උඩගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, විලාන උඩගම ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කර අනුමත කරන ලද 2023.07.20 වැනි දිනැති අංක ක. සි. 320676 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් දැක්වෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1015 (පර්චස් 0.1) ක් පමණ වන හපුගොල්ල වතුයාය නමැති පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස :

01. කැබලි අංක 1
ඉඩමේ නම: හපුගොල්ල වතුයාය; ප්‍රමාණය: හෙක්: 0.1015. (පර්චස් 0.1)

මායිම් :

උතුරට : සීමාසහිත ඉන්ටර් ඇග්‍රෝ ලංකා (ජේ.වී. පුද්ගලික) සමාගම හිමිකම් කියන හපුගොල්ල වතුයාය; නැගෙනහිරට : සීමාසහිත ඉන්ටර් ඇග්‍රෝ ලංකා (ජේ.වී. පුද්ගලික) සමාගම හිමිකම් කියන හපුගොල්ල වතුයාය; දකුණට : සීමාසහිත ඉන්ටර් ඇග්‍රෝ ලංකා (ජේ.වී. පුද්ගලික) සමාගම හිමිකම් කියන හපුගොල්ල වතුයාය; බටහිරට මාර්ගය: (මාර්ග සංවර්ධන අධිකාරිය)

හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන් : කළමනාකරණ අධ්‍යක්ෂ, ඉන්ටර් ඇග්‍රෝ ලංකා (ජේ.වී. පුද්ගලික සමාගම) හපුගොල්ල වතුයාය, විලානඋඩගම

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්කම් කියා සිටින සියලුදෙනාම, තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 දෙසැම්බර් මස 12 වැනි දින පෙ.ව. 10.00 ට අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

තවද 2023 දෙසැම්බර් මස 04 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
අකුරණ.

2023 ඔක්තෝබර් මස 30 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

EOG 11-0035

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය:- 11/3/3/1/14T

ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය:LD/05/2008/MV/408 - J

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි ,1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතෙන් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

**ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම් විස්තර**

මෙහි මහජන කටයුත්තක් යනු මොරගහකන්ද හා කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත් කරගැනීම වේ.

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, E396B අකරහැඩිය ග්‍රාම නිළධාරි වසමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් 2023.03.10 දින සම්මත කරන ලද, කැ.සි.310243 හි, කලාප අංක 28 හි, පත්‍ර අංක 4 දරන සැලැස්මේ, බිම් ප්‍රමාණය හෙක්ටයාර් 23.1688 ක් වන පහත විස්තර සඳහන් ඉඩම්

01. **කැබලි අංක** 1
ඉඩමේ නම: මොරකැටේයාය; විස්තරය: ලඳු කැලෑව; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම්පාන්නා: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ඉඩම් ප්‍රමාණය:- හෙක්. 19.7664

02. **කැබලි අංක** 3
ඉඩමේ නම: මොරකැටේයාය; විස්තරය: ලඳු කැලෑව; හිමිකම් කියන අය: රජය, මුල් හිමිකම්පාන්නා: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ඉඩම් ප්‍රමාණය:- හෙක්.3.3084

03. **කැබලි අංක** 7
ඉඩමේ නම: මොරකැටේයාය; විස්තරය: ලඳු කැලෑව; හිමිකම් කියන අය: රජය, මුල් හිමිකම්පාන්නා: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ඉඩම් ප්‍රමාණය :- හෙක්.0.0940

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, E396B අකරහැඩිය ග්‍රාම නිළධාරි වසමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් 2023.05.17 දින සම්මත කරන ලද, කැ.සි. 310243 හි,කලාප අංක 22 හි, පත්‍ර අංක 3 දරණ සැලැස්මේ, බිම් ප්‍රමාණය හෙක්ටයාර් 6.1104 ක් වන පහත විස්තර සඳහන් ඉඩම්

01. **කැබලි අංක** 1
ඉඩමේ නම: මොරකැටේයාය; විස්තරය: ලඳු කැලෑව; හිමිකම් කියන අය: රජය, මුල් හිමිකම්පාන්නා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ඉඩම් ප්‍රමාණය:- හෙක්.6.0761

02. **කැබලි අංක** 3
ඉඩමේ නම: මොරකැටේයාය; විස්තරය: ලඳු කැලෑව; හිමිකම් කියන අය: රජය, මුල් හිමිකම්පාන්නා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ඉඩම් ප්‍රමාණය:- හෙක්.0.0343

ඉහත සඳහන් ඉඩම් වලට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023.12.18 වැනි දින පූ:භා: 9.00 ට ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2023.12.11 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයන් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එස්. විජයකුමාර්,
ප්‍රාදේශීය ලේකම්,
ලග්ගල.

2023 ඔක්තෝබර් 30,
ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

EOG 11-0036

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.